# සමාජ සේවය පරමාදර්ශය කොට ගත් මාලිනී ජයසිංහ නම් වූ ඇය....



"මම අම්මා ගැන දන්නවා. එයා හැමදෙනාටම වඩා ශක්තිමත්. ඒ වාගේම චාම්. හැමදෙනාටම වැඩිය දැඩි බව සහතිකයි. ඇය නිහතමානියි. මුදු යි' එහෙත් තමාගේ හැටි හෙලි කිරීමට ලැජ්ජයි."

මැක්සිම් ගෝර්කි අම්මා නව කතාවේ අම්මා ගැන හඳුන්වන්නේ එලෙසය. මෙල්බර්න් නගරයේ වෙසෙන අම්මා වරුන් අතර එක් විශේෂිත වූ මාතාවක් පිළිබඳව සටහනක් තබන්නට සූදානම් වන විට එම පාඨය මා සිහියට නැගුනේ නිතැතිනි. ඇය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මෙල්බර්න් හි කලාවට සිතැති ලක් දූ පුතුනට මාතාවක් ම වූවාය. ඒ මෙල්බර්න් හි නාට්‍ය කලාව ආරම්භ කරන්නට පූරෝගාමී වීමෙනි. මෙල්බර්න් හි ප්‍රථ ම වරට "නරිබෑණා" "බක්මහ අකුණු" "කපුටා කපෝති" සහ "හුණු වටය" කතාව වේදිකා නාට්‍ය නිශ්පාදනය කිරීමේ භාරදූර කටයුත්ත උරට ගත් ඈ දිවා රෑ වෙහෙසෙමින් එම නාට්‍යය සාර්ථක ලෙස වේදීකා ගත කිරීමට ඇප කැප වූ අයුරු බොහෝ දෙනා සිහිපත් කරන්නේ කෘත ගුණ පූර්වකවය. මෙල්බර්න්හි සැඟවී සිටි උපන් දක්‍ෂතා සහිත නළු නිළියන්ගේ වේදිකා ආගමනයට මං පෙත් හෙළි කළ මේ කලාවට හිතැති මාතාව අන් කවරෙකු නොව අප කවුරුත් හඳුනන මාලිනී ජයසිංහ මැතිනියයි. මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ මනමේ නාට්‍යයේ පොතේ ගුරා ගේ භූමිකාවට පණ පෙවූ ශ්‍යාමන් ජයසිංහයන්ගේ දයාබර සහකාරිය වූ මාලිනී ජයසිංහ මැතිනිය තම උපන් හැකියාවන් මෙන්ම තම සැමියාගෙන් ලද පන්නරයද ශක්තියක් කොටගෙන කලාවටත් සමාජයටත් සේවය කිරීමට තම කාලයත් ශ්‍රමයත් වැය කලේ ඉන් කිසිවක් අපේක්‍ෂාවෙන් නොවේ. තමන් ගුරු වෘත්තියේ යෙදුනු අවධියේ පටන් ම වේදිකා නාට්‍ය නිශ්පාදනයට මෙන්ම දරුවන් තරඟ සඳහා සූදානම් කිරීමට මහත් වෙහෙසක් ගත් ඈ පසුව දයානන්ද ගුණවර්ධනයන්ගේ Amateur Drama Society හි ලේකම් වරිය වශයෙන් දිගු කලක් සේවය කලාය.

දයානන්ද ගුණවර්ධනයන්ගේ "ඇමති පට්ටම" වේදිකා නාට්‍යයේ කල රංගනය තුලින් වේදිකාවට පිවිසි මාලිනී ජයසිංහ මැතිනිය ඉන්පසුව මෙල්බර්න් නුවර තම වාසස්ථානය කරගත් පසුව නාට්‍ය නිශ්පාදනයට යොමු වූවාය. මෙල්බර්න් හි වේදිකා ගත වූ "මනමේ" හා "මහාසාර" නාට්‍යය වල මෙල්බර්න් නිශ්පාදනයන් සංවිධානය කිරීමෙහි ලා ජයසිංහ මැතිනිය ගෙන් ඉටු වූ කාර්ය භාරය එම නිශ්පාදනයන්ට සම්බන්ධ වූ සියළු දෙනා සිහිපත් කරන්නේ කෘතඥතා පූර්වකවයි'



මෙම සංවිධාන කටයුතුවලදී සම්බන්ධ වන සියළුම දෙනා සමඟ සුහදශීලීව කතා බස් කරමින් ආහාර පානාදියෙන් සංග්‍රහ කරමින් උර දී සිටින කර්තව්‍යයේ කුදු මහත් වගකීම් කරට ගෙන එම කාර්යයන් සාර්ථකව නිම කිරීමට අවශ්‍ය ශක්තිය කවදත් ඇය සතුව තිබිණි. මෙම කලා කටයුතුවලදී ඇය සියළු දෙනාටම ශක්තියක් වූ දිරිය කතක් ම වූවා ය.

නාට්‍ය ක්‍ෂේත්‍රයට අමතරව සමාජ සේවයට මුල්තැන දුන් මාලිනී ජයසිංහ මැතිනිය SCATS සංවිධානයේ සභාපති සහ ලේකම් යන තනතුරු දරමින් එම සංවිධානයෙන් දියත් කෙරෙන විවිධ සමාජ සේවා කටයුතු සඳහා තම නොමද දායකත්වයත් මග පෙන්වීමත් ලබා දුන්නාය. මෙල්බර්න් රසිකයන්ට හොඳ චිත්‍රපට නැරඹීමට අවස්ථාව උදා කල ඇය එම කටයුතු වලින් එක්රැ ස් වන මුදල් එම සංවිධානය හරහා ශ්‍රී ලංකාවේ සමාජ සත්කාර කටයුතු සඳහා යෙදවීමට කටයුතු කලාය. දෙවසරකට වරක් පැවැත්වෙන SCATS සංවිධානයේ නාට්‍යය උළෙල සංවිධානය කිරීමට මූලික වන ජයසිංහ මැතිනිය තමන් අසනීප තත්වයේ පසුවන විට පවා එම නාට්‍යය උළෙලේ ජයග්‍රාහකයන්ට ත්‍යාග හා සහතිකපත් බෙදා දීම සංවිධානය කිරීම පිළිබඳව එම සංවිධානය උනන්දු කලාය. එම සහතික පත් ලාභීනට සහතික ප්‍රධානය කිරීමේ උත්සවයේ දී මෙල්බර්න් ජනතාවට මෙතරම් සේවාවක් ඉටු කළ මාලිනී ජයසිංහ මැතිනියට උපහාර පිදීමට SCATS සංවිධානයේ වත්මන් සභාපති උපා උපදාස මහතා පියවර ගැනීම කාගෙ 'ත් ප්‍රශංසාවට ලක් වූ කරුණක් විය.

මෙම උපහාර උළෙලේදී මාලිනී ජයසිංහ මැතිනිය කලාවට සහ සමාජයට කරන්නා වූ සේවය අගය කරමින් ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලංකා කොන්සල් බන්දු දිසානායක මහතා ප්‍රවීන නාට්‍යවේදී පද්මකුමාර එදිරිවීර මහතා සහ ආචාර්ය සේනක පෙරේරා මහතා පුවීන ගායන ශිල්පී රෝහණ කරුණාරත්න මහතා SCATS බටහිර වික්ටෝරියානු ජ්‍යෙෂ්ඨ පුරවැසි සංවිධානයේ ලේකම් ඩී එස් යාපා මහත්මිය සහ SCATS තරුණ සංවිධානය නියෝජනය කළ දිලිනි පුනාන්දු සොහොයුරියත් ඇය කල සේවය පිළිබඳව කරනු ලබූ කථනයන් ඇය පිළිබද එම සිත් තුල අතීත මතකයන් අවදි කරවීමට සමත් විය' ඇය විසින් සංවිධානය කරන ලද බොහෝ කලා කටයුතු සඳහා ඇගේ ආරාධනයෙන් සම්බන්ධ වීමට ලැබීම භාග්‍යයක් ලෙස සලකන මා මෙම උපහාර උළෙලේ දී ඇය පිළිබඳව වචන කිහිපයක් කතා කරන්නට ලැබීම ද ගෞරවයක් කොට සලකමි.

මාලිනී ජයසිංහ මැතිනිය විද්‍යා ආචාර්යවරියක වශයෙන් විසි වසරක් පුරා ශ්‍රී ලංකා රජයේ පාසල් වලට කලා වූ අනුපමේය සේවයත් වසර 15ක් කොළඹ මියුසියස් විද්‍යාලයේ විද්‍යාචාර්ය වරියක ලෙස කරන ලද සේවවාත් එමෙන්ම ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී මාධ්‍ය හරහා විද්‍යාව ඉගැන්වීම තුළින් ඉටුකළ පුරෝගාමී මෙහෙවර හා ඇය විසින් නාට්‍ය කලාවට හා පුළුල් වශයෙන් සමාජයට කරන ලද සේවාව වෙනුවෙන් SCATS සංවිධානය විසින් එදින ඇය වෙත ස්තූති පත්‍රයක් ප්‍රදානය කරනු ලැබිණි.

මෙසේ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍රවන්නට භාග්‍යය ලද මාලිනී ජයසිංහ මැතිනියගේ උපන් දිනය පසුගිය ජනවාරි 4 දා ට යෙදී තිබිණ. තවත් බොහෝ කාලයක් කලාවට හා සමාජයට සේවය කිරීමට මෙම කලාවට හිතැති මාතාවට ශක්තියත් ධෛර්යයත් නිරෝගී සුවයත් ලැබේවායි සන්නස පාඨක සැම වෙනුවෙන් ප්‍රාර්ථනා කරමි.

ශ්‍රීනාත් මද්දුමගේ

